C
210
WIC

# පුද වාරිත්‍රයන්හි ක්‍රියාදාමය.

(බෞද්ධ හා ක්‍රිස්තියානි ආගම් කෙරෙහි අවධාරණය දක්වමින්)

'තුලනාත්මක ආගම්' පිළිබඳ පශ්චාත් උපාධිය
සඳහා දර්ශන අංශය වෙත ඉදිරිපත් කරනු
ලබන නිබන්ධනය.

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

සරත් චන්ද්‍ර වික්‍රමසිංහ
ලි.ප. අංකය. P.G 89011
ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය
පේරාදෙණිය.

500474

## සංක්ෂේපනය

මානව වර්ගයාගේ හැසිරීම් රටාවන් වැඩිමනත් තීරණය කරනු ලබන්නේ ආගමික විශ්වාසයන් හා දෘෂ්ටීන් මත බවට සාධක ඇත. මෙම හැසිරීම කෙරෙහි ආගමික විශ්වාසයන් හා ඇදහිලි ක්‍රම විශාල බලපෑමක් කිරීමට සමත් වී තිබෙන අතර ඒවා තේරුම් ගැනීමට අපට ඇති මූලික සාධකයන් ලෙස ආගමික පූජා චාරිත්‍ර නම් කළ හැක. මිනිස් හැසිරීම් රටාව කෙරෙහි බලපාන පුද චාරිත්‍ර මිනිසාගේ මුළු ජීවිතය කෙරෙහි යම් ආකාරයක පාලනයක් ඇති කිරීමට සමත් වී තිබීම වැදගත් කරුණකි. ඒවායේ විද්‍යාමාන වන දෑ කෙරෙහි ඥානාත්මක ( cognative ) තලයේ සිට බලන්නෙකුට දක්නට ලැබෙන්නේ අඩු වටිනාකමක් විය හැක.

ආගමික චාරිත්‍ර පිළිබඳ නොයෙකුත් මතිමතාන්තර තිබුණද, අද අප ප්‍රායෝගිකව අත්දකින ප්‍රත්‍යක්ෂ කරුණක් නම්, බැතිමතාගේ දෛනික ජීවිතය හා සමග ඉතා කිට්ටු සමීප සම්බන්ධතාවයක් පවත්වමින් එය මිනියාට නැතිවම බැරි ආගමික අංගයක් බවට පත්ව ඇති බවයි. ලෝකයේ බොහෝ ආගමික මූල් ඉගැන්වීම් අනුව ඊට ඉඩ නොතිබුණද, දැන් සෑම ආගමකම නැතිවම බැරි ලක්ෂණයක්ම බවට පුද චාරිත්‍ර පත්ව ඇත. මෙම නිබන්ධනය එහි රහස සොයා යන ගමනක් හා සමානය. ඉතා බලවත් ආගමික භාෂාවක් බවට පත්ව ඇති පුද චාරිත්‍ර ආගමික හැඟීම් හා එහි අර්ථයන් පිළිබිඹු කරයි. මිනිසාව වඩා තේරුම් ගත හැක්කේ ඔහු කරන හා කියන දේ තුළින් බැවින් ආගමික ලෝකය තුළ ඉටු කරන චාරිත්‍ර තුළින් මිනිසාත් ඔහුගේ මනසත් අධ්‍යයන කළ හැක. එසේම වැඩිමනත් ආගමික පුද චාරිත්‍ර, ඓතිහාසික වටිනාකමකින් යුක්තවන අතර, මිනිසා මුල පටන් එම වටිනාකම් හරහා ආගමික සම්ප්‍රදායන් වර්ධනය කරමින් පැමිණි දිගු ගමන අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. මිනිසා විසින් ගොඩ නගා ඇති සමාජ ව්‍යුහය විනිවිද දැකීමටත්, එය ආලෝකමත් කිරීමට පුද චාරිත්‍ර දායක වී ඇති ආකාරයත් හඳුනා ගැනීමට මෙම නිබන්ධනය උපකාරවනු නොඅනුමානයි.

"ආගමික දර්ශනය හා බුද්ධිය විස්තර කළ හැක්කේ කෙසේද ?
ඒවා පහසුවෙන් වචන වලට පරිවර්තනය කළ නොහැක.
ආගම තුළ ඇති විනිවිද දක්නා ඥානය විස්තර කළ හැක්කේ
එය යම් ආකාරයක රඟ දැක්වීමකට ගුඩ සැලැස්වීමෙනි".[1]

ආගම හා ආගමික ලෝකය කුමක්ද යන්න නිසිලෙස වටහා ගැනීමට චාරිත්‍ර උපකාරී වේ. එහි ලෝකය සැලසුම් කිරීමේ හා විස්තර කිරීමේ ස්වභාවය අසහාය වන්නේ, කිසිම දෙයකට වඩා, මිනිස් මනස කෙරෙහි එය බැඳී පවතින ආකාරය හා මිනිස් චින්තනය විශ්වාසනීය ස්ථානයක තැබීමට සමත්වන නිසාය. එසේම 'ලෝකය' ජීවමාන තත්වයක පැවැත්වීමෙහි ලා චාරිත්‍ර ඉටුකරන කාර්ය භාරය අසහාය එකකි. තමා හා තමාගේ ගුරුණම අතර කාලපරිච්ඡේදය තුළ පවතින හැසිරීම් රටාව, 'ආගමික ලෝකය' නිර්මාණය කර, එහි විවිධ පිළිවෙත් බිහි කිරීමට සමත් වී ඇත. ආ ගමික, සංස්කෘතික හා සමාජයීය යන පැතිකඩ 'ශුද්ධ' තත්වයක පවත්වා ගැනීමේ හැකියාවක් චාරිත්‍ර කෙරෙහි ඇත. ආගමික හැසිරීම් රටාව නිරන්තරයෙන්ම ලෝකය හැඩගැස්වීමට සමත්ව තිබීම වැදගත් කරුණකි.

මිනිසාව යහපත් පැවැත්මේ ගමන් කරවීමට අත්‍යවශ්‍ය ආචාරධර්ම ආරක්ෂා කිරීමක්ද පූද චාරිත්‍ර තුළ ඇත. ලෝකයට අවශේෂ මිනිස් ධර්ම බිහි කළ ආගමික ශාස්තෘවරුන්ට වන්දනාමාන කිරීමෙන් සිදුවන්නේ, ඔවුන්ගේ ඉගැන්වීම් කෙරෙහි නැවත නැවත මෙනෙහි කිරීමක් ය. ක්‍රිතු බැතිමතුන් සෑම ඉරු දිනකම දේවස්ථානයේ සවන් දෙන දේශන හා සක්‍රමේන්තු තුලින් ක්‍රිස්තුස්වහන්සේ තමන්ගෙන් බලාපොරොත්තු වන ජීවන රටාව නැවත නැවත සිහිපත් කරවයි. බෞද්ධයා ඔවුනට ආවේනික වූ බුදුන් වැඳීම ඇතුළු චාරිත්‍ර තුලින්ද තම ජීවිතයේ ආචාරධර්ම වර්ධනය කර ගැනීමට අධිෂ්ඨාන කර ගනිති. පූදචාරිත්‍ර ආගමික ලෝකය පමණක් නොව මුළු

මානව වර්ගයාගේ පැවැත්ම කෙරෙහි ඉතා ගැඹුරු බලපෑමක් ඇති කරන නිසා පූද චාරිත්‍ර ඉතා වැදගත් ස්ථානයක් උසුලති.

මෙහි අරුම පුදුම බලවත්කම තේරුම් ගැනීමට නම් ඕනෑම ධර්මයක මූලික ඉගැන්වීම් සහ එම ධර්මයේ ප්‍රායෝගික පැවැත්ම අතර ඇත්තාවූ සම්බන්ධ-තාවය පිළිබඳ දැනුමක් ලබා ගත යුතුව ඇත. මූල් ධර්ම ඉගැන්වීම් වල නොමැති විවිධ චාරිත්‍ර ආගම් තුලට ඇතුල්ව පෝෂණය වන ආකාරය පිළිබඳ පැහැදිලි චිත්‍රයක් එකී අධ්‍යයනයේ දී හමුවනු ඇත. එම නිසා විද්වතුනට හෝ බැතිමතුනට චාරිත්‍ර විද්‍යානුකූල හෝ තර්කානුකූල නොවැති යයි අවතක්සේ-රු කළ නොහැක. මෙම වටිනාකම උරගා බැලීමක් මෙම නිබන්ධනයෙන් කෙරෙනු ඇත.

නිබන්ධනයේ මුල සිට අග දක්වා 'ප්‍රපංච වේදී' ක්‍රමය (Phenomenological Method ) අනුගමනය කරනු ඇත. ඇති දෑ කෙරෙහි ඒ ආකාරයෙන්ම බැලීම මෙම ක්‍රමයේ විශේෂත්වයයි. "ප්‍රපංච වේදය" යන්න පළමුව ඉදිරිපත් කළේ 1887 දී චන්ටෙපි ඩී ල සව්සයෙ විසිනි. ඔහු ආගම තේරුම් ගන්නට උත්සාහ කළේ එහි හරය හා එය ප්‍රකාශ වන ආකාරය අනුවය"[2] මෙම අදහස අනුගමනය කරමින් ජෙරඩස් වැන්ඩර් ලියුව් හා හුසර්ල් වැනි ආචාර්යවරුන් ප්‍රපංචවේදීව ආගම තේරුම් ගැනීමේ හා විස්තර කිරීමේ වටිනාකම ලෝකයාට පෙන්වා දුනි. මෙම ක්‍රමවේදය අනුව, කලින් තීරණ ගෙන අධ්‍යයනයකට යොමුවිය නොහැකි අතර තමා දකින දේ දකින අයුරින් විග්‍රහ කිරීම වැදගත් වේ. ආගම පිළිබඳ දර්ශනවාදයේ මෙම ක්‍රමවේදය ප්‍රබල ස්ථානයක් උසුලයි. එම නිසා පූද චාරිත්‍රවල ක්‍රියාදාමය විග්‍රහ කිරීමේ දී මම එකී ක්‍රමවේදය අනුගමනය කරමි.

ආගමික පූද චාරිත්‍රවල ක්‍රියාදාමය සොයා යෑමේ දී, මුල්ම මිනිස් සමාජයේ ආගමික චාරිත්‍රයන් පිළිබඳ පළමුවන පරිච්ඡේදය සාකච්ඡා කරනු ඇත. ආගම කෙසේ ආරම්භ වී, විවිධ චාරිත්‍ර ඊට ඇතුල්වූයේ කෙසේද යන්න ප්‍රශ්න කිරීමේ දී විවිධ විද්වතුන්ගේ අදහස් ඇතුලත් කිරීමට අමතක නොකලෙමි. මෙහිදී ආගම හෝ පූද චාරිත්‍රවල ප්‍රාරම්භය කෙසේවීදැයි පැහැදිලි ලෙස හඳුනා ගැනීමට නොහැකි වුවද, එකල මානවයාගේ සමාජ සංස්කෘතික සංදර්භය තුල, එවක් පැන නැගීමට හේතු සාධක වූ ඉඟි කිහිපයක් ලබාගත හැක. එසේම ලංකාවේ ආගමික ප්‍රභවය පිළිබඳව ද එහිදී සාකච්ඡා කෙරෙනු ඇත.

දෙවන පරිච්ඡේදයේ සාකච්ඡා කරනුයේ ආගමික පූද චාරිත්‍ර හා සම්බන්ධ පවතින මිථ්‍යාව පිළිබඳවයි. සෑම ආගමික ධර්මකාණ්ඩයන් ගොඩනැගීමේ දී ඒ හා බැඳී පවතින මිථ්‍යා කතාවන් ඇත. මෙම මිථ්‍යාවන් නැවත නැවත ප්‍රතිනිර්මාණය කිරීමක් පූද චාරිත්‍ර තුලින් සිදු කෙරේ. නත්තල සමරන සෑම විටකම ඒ පිළිබඳ වූ මිථ්‍යාව නිරූපනය කරනු ලබයි. සෑම නිවසකම ගවගාලක් තැනෙයි. සෑම දේවස්ථානයකම සාමය පිළිබඳ දේශනා පැවැත්වෙයි. මිථ්‍යා හා පූදචාරිත්‍ර අතර ඇති කිට්ටු සම්බන්ධතාවය ගැඹුරු ලෙස නිරීක්ෂණය කිරීමක් මෙම පරිච්ඡේදයෙන් කෙරෙන අතර, පූද චාරිත්‍ර හා කාලය පිළිබඳ සංවාදයක් ද එහිම අඩංගු වේ. පූද චාරිත්‍ර පවත්වන කාලය නැතහොත් අවස්ථාව ඉතා ශුද්ධවූ එකකි. එය සාමාන්‍ය අවස්ථාවකට වඩා වෙනස් වූවකි. නිවසක පිරිතක් පැවැත්වෙන අවස්ථාව ඉතා සුවිශේෂ හා ශුද්ධ එමෙන්ම කැපවූ එකකි. එම අවස්ථාවට සහභාගී වන සියළු දෙනාම ඇතුල් වන්නේ ඉතා වැදගත් ආගමික අවස්ථාවකටය. පූද චාරිත්‍ර ඉටු කරන අවස්ථාව හා ඒ තුලින් ලබන අත්දැකීම ඉතා බලවත් වූ එකක් බව ප්‍රසංව වේදීව බැලීමේ දී තේරුම් ගත හැක.

UNIVERSITY OF PERADENIYA
10-12-1997
LIBRARY

පූද චාරිත්‍ර පිළිබඳව ඉතාම අඩු අවධාරණයක් කෙරෙන බෞද්ධාගම තුල අද විවිධ චාරිත්‍ර දක්නට තිබීම ගවේෂණය කළ යුතු කරුණක් බැවින් තෙවන පරිච්ඡේදය ඒ සඳහා වෙන්කර ඇත. බොහෝ දුරට තර්කවාදීව ගොඩනැගුණ දර්ශනයක් ලෙස බෞද්ධ දර්ශනය හැඳින්විය හැක. තර්කයට හෝ විද්‍යාවට පූද චාරිත්‍ර හසුවන්නේ ඉතා අල්ප වශයෙනි. පරස්පර අදහස් දෙකක් මුණ ගැසෙන්නේ කෙසේද ? ඊට පාදක වන හේතු සාධක කවරේද ? විවිධ පූද චාරිත්‍ර නිසා බෞද්ධ දර්ශන ආලෝකමත් වේද ; අඳුරුවේද ? තුමක් තුමකින් ආරක්ෂාවේද, යැපේද ? ඉහත ප්‍රශ්න පිළිබඳව සැකවින් සාකච්ඡා කිරීමක් තෙවන පරිච්ඡේදයේ සිදුවන අතර, අද ලක්දිව බුදු දහමෙහි පූද චාරිත්‍ර කෙරෙහි මහායාන බලපෑම් පිළිබඳවද කෙටි හැඳින්වීමක් කෙරෙනු ඇත. අද ජනප්‍රිය වෙමින් පවතින, බැතිමතුන්ගේ භක්තියට ලක්වී ඇති බෝධි පූජාව, ධාතු වන්දනාව වැනි පූද පූජා කරණකොටගෙන බැතිමතා ආගමික දර්ශනය හා පවත්වන සම්බන්ධතාවය මෙම කොටසින් අනාවරණය කෙරෙයි.

කිතු බැතියකු වශයෙන් එහි ඇති පූද පූජා චාරිත්‍ර පිළිබඳ අධ්‍යයන කිරීම වටිනා කර්තව්‍යයක් බැවින් එම කාර්ය භාරයේ ප්‍රතිඵල වෙනුවෙන් සතරවන පරිච්ඡේදය වෙන් වී ඇත. කිතු දහම රෝමානු කතෝලික හා නොවන යන කොටස් දෙකකින් සමන්විත වීමට බලපෑ එක් ප්‍රධාන කරුණකි පූද චාරිත්‍ර. රෝමානු කතෝලික සභාව වැඩිමනත් පූද චාරිත්‍ර අවධාරණය කරයි. රෙපරමාදු සභාවන් පූද චාරිත්‍ර වලට වඩා මිනිස්-දේව සම්බන්ධතාවය කෙරෙහි වැඩි අවධාරණයක් දෙමින් චාරිත්‍ර කෙරෙහි එතරම් උනන්දුවක් නොදැක්වුවද, ලංකාවේ ජනප්‍රිය කිතු දහම රෝමානු කතෝලික වී ඇත. මෙහි රහස සොයායෑමේ දී පූද පූජා ඊට ප්‍රධාන වශයෙන් බලපා ඇති බව හඳුනා ගැනීමට හැකිවිය. එසේ මෙම දෙකොටසටම පොදුවූ ආගමික චාරිත්‍ර වල ඇති ධර්මානුකූල වෙනස්කම් පිළිබඳවද මෙම කොටසින් සාකච්ඡා කෙරෙනු ඇත. බව්තීස්මය ස්වාමීන්ගේ රාත්‍රී භෝජනය හා හස්තාලේපය වැනි චාරිත්‍ර පිළිබඳව මෙහෙදී ගැඹුරින් අධ්‍යයනය කෙරෙනු ඇත. මා නියෝජනය කරන රෙපරමාදු සභාවේ

බැප්ටිස්ට් නිකාය කිතුනු කොටස් අතර පුද චාරිත්‍ර කෙරෙහි අඩුවෙන්ම අවධාරණය කරන කොටස වී ඇති අතර ජනතාව අතරට යෑමේ දී, සංඛ්‍යාත්මකව ද ඉතාම අඩු කොටසක් බවට පැහැදිලි ලෙස ප්‍රකාශ වී ඇත. පුද පූජා චාරිත්‍ර වලට වඩා, දේව වචනය හා ඒ තුල ඇති සත්‍ය කෙරෙහි බැතිමතා යොමු කරවීම ප්‍රධාන අභිලාශය වී ඇතත් බැප්ටිස්ට් නිකාය තුල ජනතා සහභාගීත්වය අඩු මට්ටමක පවත්නේ කවර හේතූන් නිසාද ? මේ ප්‍රශ්නය පිළිබඳ කතා කිරීමට ඡේදයක් වෙන්කර ඇත්තේ ආත්මාර්ථකාමිකමකට වඩා ඒ තුල ඇති යථාර්ථය සොයා ගැනීම පිණිසය.

පුද පූජා චාරිත්‍රයන්හි මනෝවිද්‍යාත්මක භාවය පස්වන පරිච්ඡේදයෙන් සාකච්ඡා කරනුයේ ඒ අතර ඇති සමීප සම්බන්ධකම පිළිබඳ ආලෝකයක් ලබා ගැනීමටය. මිනිස් හැසිරීම් රටාව මිනිස් මනය මත රඳා පවතිනු ඇත. ආගමික හැසිරීම් රටාවද ඉන් පරිබාහිර නොවනු ඇත. එම නිසා මිනිසා ආගමික ලෝකයෙහි සැරි සරන විට එහි පවත්නා පුද පූජා චාරිත්‍ර සියල්ල මනස හා බැඳී පවතී. මෙකී සම්බන්ධතාවය පුද චාරිත්‍රයන් කෙරෙහි ශුභවාදී හෝ අශුභවාදී බලපෑම් ඇති කරනු ඇද්ද ? ඒ ගරහා මිනිස් ජීවිතය ඉදිරියට ගමන් කරනුයේ කෙසේද යන්න සාකච්ඡා කිරීම මෙම පරිච්ඡේදයේ ප්‍රධාන ලක්ෂණය වී ඇත.

මෙම නිබන්ධනයෙන් ප්‍රකාශ කරන්නට උත්සහ කරනුයේ, පුද පූජා චාරිත්‍ර ආගමික ලෝකය හරවත් කරමින් මිනිස් ජීවිත හා බැඳී පවතින ආකාරය තේරුම් ගැනීමට දරණ වෑයමයි. ඉතා ප්‍රවේශමෙන් හා දැනුමකින් එමෙන්ම සූදානමකින් , හැසිරවීම තුලින් එය ජන ජීවිතය හා සමාජය පොහොසත් කරන්නාවූ අංගයක් බවට පත්කර ගතයුතු අතර පුද චාරිත්‍ර හුදු හිස් බවින් හෝ මනඃකල්පිත තත්වයෙන් මුදවා ගැනීමට ද අධිෂ්ඨාන කරගත යුතුව ඇත. මිනිසුන් ඊට වහල් නොවී, ඒ තුලින් යථාර්ථය කරා ගමන් කිරීමට, පුද චාරිත්‍ර පියගැට පෙළක් කරගැනීමෙන් ඊට සාධාරණත්වයක් ලබා දිය හැක.